**බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම**
**2012 ජූලි මස 17 වන දින පෙ.ව. 9.30 ට**

# න්‍යාය පත්‍රය

I. **සභාපතිතුමාගේ නිවේදන**

II. **ලිපි ලේඛන පිළිගැන්වීම**

III. **කාරක සභා වාර්තා පිළිගැන්වීම**

IV. **පෙත්සම්**

V. **ප්‍රශ්න**

VI. **නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා**

VII. **අමාත්‍යාංශ නිවේදන / අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ**

VIII. **පෞද්ගලික පැහැදිලි කිරීම්**

IX. **සභාවේ කටයුතු**

**ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට :**

යෝජනාව :

"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය "

X. **පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු**

**01. ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා**

" කොළඹ නගරයේ ජීවත් වන ජනතාවගේ දැනුම වර්ධනය කිරීමට මෙන්ම කොළඹ අවට ජනතාවට දැනුම ලබා ගැනීමේ කේන්ද්‍රස්ථානයක්ද වූ කොළඹ මහජන පුස්තකාලය හෙට දවසට නොව අද දවසට ගැලපෙන ආකාරයටද සංවර්ධනය වී නොමැති බැවින් කොළඹ මහ නගර සභාව මඟින් ප්‍රතිපාදන යොදවා එය ලොව නවීනතම පහසුකම් සහිත අංගසම්පූර්ණ පුස්තකාලයක් බවට සංවර්ධනය කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කර සිටියි ."

**(යෝ/v(01)12/06)**

**02. ගරු අශෝකා ලංකාතිලක මන්ත්‍රීතුමිය**

" වර්තමානයේදී පාසල් වල පවත්නා භෞතික සම්පත් බොහෝ සෙයින් සතුටුදායක මට්ටමක පවතී. එසේම අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයද සතුටුදායක මට්ටමක පවතී. එසේ වුවත් පාසලක විදුහල්පතිවරයෙකු විශ්‍රාම යන විට අලුතින් විදුහල්පතිවරයෙකු පත්කිරීමට කාලයක් ගතවන අවස්ථා බොහෝ ඇති අතර, එවැනි අවස්ථාවලදී වැඩබැලීමේ පදනම මත විදුහල්පතිවරයෙකු පත්කර පාසල පවත්වා ගෙන යනු ලබයි. එවැනි වැඩබලන විදුහල්පතිවරුන් විදුහල්පති තනතුරේ කොපමණ හොඳින් කටයුතු කලද ඔවුන්ට එම තනතුරේ ස්ථිර වීමට අවස්ථාවක් නොමැත. මෙවැනි තත්වයක් තුල කොතරම් දියුණු මට්ටමක පැවති පාසලක්වුවත් පහල මට්ටමකට වැටීමට ලක් විය හැකිය .

මෙම තත්වය මග හැරවීම සඳහා බස්නාහිර පළාත තුල සුදුසුකම් සහිත ගුරුවරුන් තෝරා පුහුණු කිරීමෙන් හෝ විදුහල්පති විභාග පවත්වා සුදුස්සන් තෝරා ගෙන විදුහල්පති සංචිතයක් ඇති කළ යුතු යැයිද, යම් පාසලක විදුහල්පතිවරයෙකු විශ්‍රාම ලබන විටම ඒ වෙනුවට එම සංචිතයෙන් විදුහල්පතිවරයෙකු පත් කිරීමට පියවර ගත යුතු යැයිද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි"

**(යෝ/v(01)12/07)**

## XI. පොදු කටයුතු

**01. ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදාහැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප) :**

**<u>1991 අංක 7 දරණ බස්නාහිර පළාතේ මෝටර් වාහන ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන නියෝග</u>**

1991 අංක 7 දරණ බස්නාහිර පළාතේ මෝටර් වාහන ප්‍රඥප්තියේ 129(1) වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදාහැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව සාදන ලද,

" ***2011 මෝටර් වාහන ගාස්තු පිළිබඳ නියෝග*** " යනුවෙන් හඳුන්වනු ලබන නියෝග,

අංක 1730/18 හා 2011 නොවැම්බර් මස 03 වන බ්‍රහස්පතින්දා දාතමින් යුතු, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ, ගැසට් පත්‍රය **(IV (අ) වැනි කොටස - පළාත් සභා)** මගින් ප්‍රකාශයට පත්කර ඇති අතර, එම නියෝග යථෝක්ත ප්‍රඥප්තියේම 129(3) උප වගන්තියට අනුකූලව,

අනුමැතිය සඳහා 2012.02.06 දින මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව තවදුරටත් 2012.03.28 දින පැවැති ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී සාකච්ඡාකර එම කාරක සභාව තම නිර්දේශයන් ද ඉදිරිපත් කර ඇති හෙයින් එම නිර්දේශයන් පිළිබඳව ද සැලකිලිමත්ව, යථෝක්ත නියෝග අනුමත කළ යුතුය.

**02. ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප.):**

<u>2010 අංක 06 දරන බස්නාහිර පළාතේ සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීති</u>

2010 අංක 06 දරන බස්නාහිර පළාතේ සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියේ 23 වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව සාදන ලද,

***"බස්නාහිර පළාත් සභාවේ 2010 අංක 06 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ රීති"*** නම් වූ රීතින්,

අංක 1698/22 හා 2011 මාර්තු මස 24 වැනි බ්‍රහස්පතින්දා දාතමින් යුතු, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය [IV (අ) වැනි කොටස - පළාත් සභා] මගින් ප්‍රකාශයට පත් කර ඇති අතර එම රීතීන්, යථෝක්ත ප්‍රඥප්තියේ 23(3) උප වගන්තියට අනුකූලව,

අනුමැතිය සඳහා 2012.03.20 දින මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව තවදුරටත් 2012.03.28 දින පැවැති ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී සාකච්ඡාකර එම කාරක සභාව තම නිර්දේශයන් ද ඉදිරිපත් කර ඇති හෙයින් එම නිර්දේශයන් පිළිබඳව ද සැලකිලිමත්ව, යථෝක්ත රීතීන් අනුමත කළ යුතුය.

**03. ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති සහ වෙළඳ කටයුතු විෂයභාර අමාත්‍යතුමා (බ.ප) විසින් පිළිගන්වනු ලබන ප්‍රඥප්තිය :**

**" බස්නාහිර පළාතේ 2012 අංක . . . . . . දරණ ඉඩම් සංවර්ධන ප්‍රඥප්තිය."**

ප්‍රඥප්ති කෙටුම්පත පළමුවර කියවීම

බස්නාහිර පළාත තුළ පිහිටි රජයේ ඉඩම්, රජය හෝ පළාත් සභාව විසින් ප්‍රයෝජනයට ගැනීම විධිමත් කිරීම සඳහාත් යම් පුරවැසියෙකුට හෝ යම් සංවිධානයකට පවරා දීම සඳහාත් එම ඉඩම් නියාදනය කිරීම පිළිබඳව පළාත් සභාවේ උපදේශය සඳහා විධිවිධාන සැලැස්වීම සඳහාත් ඊට ආනුශංගික වූ කාරණා සඳහාත් බස්නාහිර පළාතේ 2002 අංක 07 දරණ ඉඩම් සංවර්ධන ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහාත් වූ ප්‍රඥප්තියකි.

## XII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2012.07.04. දින.
සභා ලේකම් කාර්යාලය (බ.ප),
බස්නාහිර පළාතේ පළාත් සභාව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.